දිවි තොර කරගැනීම් යනු බැරෑරුම් මහජන සෞඛ්‍ය ගැටළුවක් බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. එනිසාම, සමාජයේ සිදුවන දිවි තොර කරගැනීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට මාධ්‍ය කටයුතු කළ යුතු නමුත්, ඒ ඔස්සේ අනුකාරක දිවි තොර කරගැනීම් සිදුවීම වැළැක්වීම සඳහා ප්‍රවේසම් වීමත්, මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව එම වාර්තාකරණයන් සිදුකිරීමත් අත්‍යවශ්‍ය වේ.

දෙහිඅත්තකණ්ඩිය ඉන්ධන පිරවුම්හලෙහි ආරක්ෂාවට යොදවා සිටි හමුදා සෙබළෙකු මැයි 23, 2022 දින අලුයම දිවි තොර කරගැනීමේ පුවත මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබූ ආකාරය ඊට උදාහරණයකි.

එහිදී දිවි තොර කරගත් ආකාරය සඳහන් වී තිබිණි. මෙම සිදුවීම මහජන බැදියාවට අයත් බව සැලකූ විට, දිවි තොර කරගත් ආකාරය සඳහන් වී තිබීම නොසලකා හැරිය හැක. කෙසේ නමුත්, එය අප විසින් ආවරණය කොට දක්වා තිබේ.

ඒ හැරෙන්නට මේ පිළිබඳ පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක සඳහන් වී නොතිබුණි. වර්තමානයේ ශ්‍රී ලාංකික සමාජය මුහුණ පා ඇති අර්බුදකාරී තත්වයද පසුතල කොට ගනිමින් බැලූ විට, මෙවැනි සිදුවීම් වාර්තා කිරීමේදී හදිසි උපකාරක අංක සඳහන් කිරීමේ භාවිතාවකට මාධ්‍යයන්ට අනුගත විය හැකි නම්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් ජීවිතයක් බේරා ගැනීමට ඉඩ ලැබෙනු ඇත.

ඔබේ අදහස?

(එදින මෙම දැක්වෙන පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ මෙම පුවත වාර්තා වී නොතිබුණි.)

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://media.samaritans.org/.../Guidance_for_reporting...